# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2026 ජනවාරි / පෙබරවාරි

මානවශාස්ත්‍ර පීඨය

## ප්‍රාසංගික කලා - නර්තනය
(නව නිර්දේශය)

ආසියානු සම්භාව්‍ය නර්තන සම්ප්‍රදා - **PADN 38214**

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. චීනයේ ප්‍රචලිත මකර නර්තනය (Dragon Dance), සිංහ නර්තනය (Lion Dance), රිබන් නර්තනය (Ribbon Dance), අවාන් නර්තනය (Fan Dance) සහ මල් නර්තනය (Flower Dance) ඇසුරින් චීනයේ නර්තන කලාවේ සංකීර්ණත්වය විමසන්න.

02. ඉන්දීය නර්තනයේ උපයුක්ත නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය සංකල්පය පිළිබඳ භරත නාට්‍යම් සම්ප්‍රදාය ඇසුරෙන් විග්‍රහ කරන්න.

03. ජපාන නර්තන කලාවේ මූලාරම්භය හඳුන්වා, එහි ප්‍රචලිත කගුරා නර්තන (Kagura Dance) ශෛලිය පිළිබඳ පහදන්න.

04. කථක් නර්තනයේ ගුරුකුල විශේෂතා පිළිබඳ ඔබ උගත් ගුරුකුල දෙකක් ඇසුරෙන් විමසන්න.

05. රාජ සභාව ආශ්‍රිතව වර්ධනය වූ කොරියානු නර්තන කලාව පිළිබඳව විමසුමක යෙදෙන්න.

06. කථකලි නෘත්‍ය නාටකයෙහි චරිත උද්දීපනයෙහි ලා ආහාර්ය අභිනයේ උපයෝගීතාවය පිළිබඳ විමසන්න.

07. නර්තන කලාවේ සම්මිශ්‍රණාත්මක ලක්ෂණ ඇතිවීම කෙරෙහි ඉන්දීය නර්තනයේ ආභාසය ලද ආකාරය තායිලන්තය සහ ඉන්දුනීසියාව යන රටවල නර්තන අංග උදාහරණයට ගනිමින් විග්‍රහ කරන්න.

08. භූගෝලීය සාධක හා ආගමික සංකල්ප මණිපුරි නර්තන සම්ප්‍රදායේ ප්‍රභවය හා විකාශයට හේතු වී ඇත. විමසන්න.

09. හින්දු සහ බෞද්ධ යන ආගම් මූලික කරගනිමින් නිර්මාණය වී ඇති නර්තනාංග පිළිබඳ නේපාලයේ නර්තන කලාව ඇසුරින් විමසන්න.

*********************************